අධිකරණ අමාත්‍යාංශය நீதி அமைச்சு MINISTRY OF JUSTICE

ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය
தேசிய ஒற்றுமை மற்றும் நல்லிணக்கத்திற்கான அலுவலகம்
Office For National Unity And Reconciliation

ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය 2024 අංක 01 දරණ පණත මගින් පිහිටුවන ලද ආයතනයක් වන අතර උක්ත කාර්යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සංවර්ධන නිලධාරි — තනතුරු සංඛ්‍යාව : 16

සේවා ගණය : **MA 3**

## තනතුරෙහි ස්වභාවය

- ආයතනයෙහි පරිපාලන කටයුතු සංවිධානය කිරීමේදී පරිපාලන නිලධාරිට සහයෝගය දීම.
- ආයතනයෙහි සියලුම නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධ කාර්යයන් සැකසීම
- ආයතනයේ සේවක මහත්ම මහත්මීන්ගේ සුබසාධක පහසුකම්, පාරිතෝෂික, දීමනා, සේවක අර්ථසාධක අරමුදල, අනෙකුත් ප්‍රතිලාභ ගෙවීම් පිළිබඳව සියලු කටයුතු සිදුකිරීම.
- වැඩසටහන් අංශයේ නිලධාරින් පවරන රාජකාරි ඉටුකිරීම.
- අවශ්‍ය අවස්ථාවන්හී දී අංශයේ ප්‍රතිසංවිධාන කටයුතු හා නව පාලන ක්‍රම හඳුන්වාදීම හා ඊට අදාළව ඉහළ කළමනාකරණයට යෝජනා ඉදිරිපත් කිරීම.
- ආයතනය විසින් සංවිධානය කරනු ලබන වැඩසටහන් වලට අදාළ සියලුම අත්තිකාරම් ලබාගැනීම්, ප්‍රතිපූරණය කිරීම්, පියවීම්, ගෙවීම් වලට අදාළ සියලුම වවුචර් පත් පිළියෙළ කිරීම, ලියකියවිලි ගොනුගත කර ගොනුවේ සටහන් ලියා නිර්දේශයට හා අනුමැතියට ඉදිරිපත් කිරීම, ඉදිරි කටයුතු සඳහා ගිණුම් අංශය වෙත භාරදීම.
- ආයතනයෙහි සම්බන්ධයෙන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය නිලධාරින් සමග සම්බන්ධීකරණය, සැලසුම් කරනු ලබන වැඩසටහන් බිම් මට්ටමේ ක්‍රියාත්මක කිරීමට සහයෝගය දීම.
- විගණන විමසුම් වලට අදාළ වැඩසටහන් මෙහෙය වූ අංශ වෙත අවශ්‍ය තොරතුරු ඉල්ලා අභ්‍යන්තර ලිපි සකස් කර යැවීම, අදාළ තොරතුරු ලැබුණු පසු ඒවා ගලපා නියෝජ්‍ය අධ්‍යක්ෂ මූල්‍යගේ අනුදැනුම මත ගොනුගත කර විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කිරීම හා ගොනු පවත්වාගෙන යාම
- අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම.

## සුදුසුකම් (පහත 1 හෝ 2)

රාජ්‍ය පරිපාලනය / සාමය හා ගැටුම් නිරාකරණය / මානව සම්පත් කළමනාකරණය / නීතිය / සමාජ විද්‍යාව / ව්‍යාපාර පරිපාලනය / තොරතුරු තාක්ෂණය /වාණිජ්‍ය / මූල්‍ය කළමනාකරණය / ව්‍යාපාර කළමනාකරණය / ජාත්‍යන්තර සබඳතා හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

## වයස් සීමාව

අවු : 22 ට නො අඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය.

---

## වැටුප් පරිමාණය

**MA 3 - 2025 - රු. (53,940 - 10 x 800 - 11 x 1,190 - 10 x 1,320 - 5 x 1,350 - 94,980)**

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)